ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2017 සැප්තැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, September 2017

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

10 ශ්‍රේණිය
*Grade 10*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
- (iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. ව්‍යාපාර බිහිවීමට ප්‍රධාන පදනම සැලසී ඇත්තේ,
1. උපකාරක සේවා 2. භාණ්ඩ හා සේවා 3. ලාභය හා තෘප්තිය 4. අවශ්‍යතා හා වුවමනා

02. ව්‍යාපාරයක විවිධ අරමුණු පවතී. ඒ අතුරින් පුද්ගල දක්ෂතා හා සම්බන්ධ වූ ව්‍යාපාරික අරමුණ වනුයේ,
1. සේවක සුභ සාධනය 2. ලාභ ඉපයීම
3. රැකියා උද්පාදනය 4. ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම.

03. අවශ්‍යතා පොදු හා සීමිත වේ. වුවමනා,
1. ගණනය කළ නොහැක. 2. විවිධ හා සරළ වේ. 3. අසීමිත වේ. 4. විවිධ හා අසීමිත වේ.

04. A - ඇඳුම් B - බත් C - ප්‍රවාහනය D - රක්ෂණය
E - විනෝදය F - මෝටර් රථ

ඉහත දෑ අතුරෙන් පුද්ගල අවශ්‍යතා හා වුවමනා කාණ්ඩ ගත කළ විට P හා Q සඳහා පිළිවෙලින් ලැබෙන පිළිතුර වනුයේ,
1. P - A, C, E Q - B, D, F 2. P - A, D, C Q - B, E, F
3. P - A, E, F Q - B, C, D 4. P - B, E, F Q - A, C, D

05. නිෂ්පාදන සාධක ලෙස සලකනුයේ,
1. ශ්‍රමය, ප්‍රාග්ධනය, නව්‍යතා, අවදානම් 2. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, නව්‍යතා
3. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය 4. භූමිය, ප්‍රාග්ධනය, වැටුප, අවදානම්

06. භාණ්ඩ හා සේවා සසඳන කල සේවා වල දැකිය හැකි ලක්ෂණ නිවැරදිව ඇතුළත් වනුයේ,
1. අස්පෘශ්‍ය බව, විවිධත්වය, ගබඩා කළ නොහැකි වීම. 2. ස්පෘශ්‍ය බව, විවිධ වීම, ගබඩා කළ හැකි වීම.
3. අස්පෘශ්‍ය වීම, ඒකාකාරී වීම, හිමිකරුවෙකු සිටීම. 4. ස්පෘශ්‍ය වීම, ඒකාකාරී බව, ගබඩා කළ හැකි වීම.

07.



ඉහත දැක්වෙනුයේ, ව්‍යාපාර පරිසර වර්ගීකරණයකි. එහි A කාණ්ඩයට ඇතුළත් සාධක වනුයේ,
1. අයිතිකරුවන්, සේවකයන්, ගනුදෙනුකරුවන් 2. කළමණාකරුවන්, සේවකයන්, අයිතිකරුවන්
3. ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, තරගකරුවන් 4. අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, කළමණාකරුවන්

08. රජය ව්‍යාපාර කෙරෙහි මෙන්ම ව්‍යාපාර රජය කෙරෙහි ඇල්මක් දක්වනුයේ,
1. රැකියා උද්පාදනය 2. සමාජ සේවා සුබ සාධනය
3. ආදායම් බදු නිසි ලෙස ගෙවීම 4. දිරි ගැන්වීම් ලබා ගැනීම

09. පහත සංවිධාන අතුරින් ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානය වනුයේ,
1. රාජ්‍ය සමාගම් 2. හවුල් ව්‍යාපාර 3. දෙපාර්තමේන්තු 4. සමුපකාර සමිති

10. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම සමාජික සංඛ්‍යාව සඳහන් වන පනත වනුයේ,
1. 2007 අංක 7 දරණ සමාගම් පනත 2. 1890 හවුල් ආඥා පනත
3. 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත 4. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

11. සමුපකාර සමිතියක ලක්ෂණයක් නොවනුයේ,
1. සාමූහික හා ප්‍රජාතන්ත්‍රවාදි පාලනය 2. අවම සාමාජික සංඛාව 10 කි.
3. කොටස් නිකුත් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනිම. 4. අතිරික්තය සාමාජිකයින් අතර පෞද්ගලිකව බෙදි යාම

12. ව්‍යාපාර සංවිධාන කිහිපයක් හා ඒවාට අදාල කරුණු කිහිපයක් පහත වේ.

| **ව්‍යාපාර සංවිධාන** | **අදාල කරුණු** |
|---|---|
| A - හවුල් ව්‍යාපාර | 1. කොටස් නිදහසේ පැවරිය හැක. |
| B - දෙපාර්තමේන්තු | 2. අවමය 2 හා උපරිමය 20 වේ. |
| C - සීමා සහිත සමාගම් | 3. ප්‍රජාතන්ත්‍රවාදි පාලනය |
| D - සමුපාකාර | 4. නෛතික පුද්ගලභාවයක් නැත. |

ඉහත කරුණු නිවැරදිව ගලපා ඇත්තේ,
1. A - 2, B - 3, C - 1, D - 4 2. A - 3, B - 4, C - 1, D - 2
3. A - 2, B - 4, C - 1, D - 3 4. A - 4, B - 3, C - 2, D - 1

13. තේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරිමේ දි අනුගමනය කළ යුතු පියවර කිහිපයක් පහත වේ.
A - ග්‍රාම නිලධාරි වාර්තාව ලබා ගැනීම.
B - ලියාපදිංචි කිරිමේ සහතිකය ව්‍යාපාරික ස්ථානයේ ප්‍රදර්ශනය කිරිම.
C - අදාල ඉල්ලුම්පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනිම.
D - ලියාපදිංචි විමේ ගාස්තුව පලාත් සභාවට ගෙවිම.
ඉහත පියවර නිවැරදිව ඇතුළත් පිළිතුර වනුයේ,
1. C, D, A, B 2. C, A, D, B 3. A, C, B, D 4. C, B, A, D

14. ව්‍යාපාර සංවිධාන පෞද්ගලික හා පොදු අංශ වශයෙන් වර්ගීකරණය කරනු ලබන පදනම වනුයේ,
1. ව්‍යාපාරයේ අරමුණ අනුව ය. 2. ලාභ අලාභ බෙදා ගන්නා පදනනම අනුව ය.
. ව්‍යාපාරයේ පරිමාණය අනුව ය. 4. හිමිකාරිත්වය අනුව ය.

15. ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
1. සී/ස ගවේෂණ සමාගම 2. පෙරේරා සහ සහෝදරයෝ
3. සාගර එන්ට්‍රප්‍රයිසස් 4. එකමුතු යෞවන සමාජය

ඉහත නිදසුන් හි ඇතුළත් ව්‍යාපාර සංවිධාන නිවැරදිව අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,
1. සංස්ථාපිත සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමිති සංවිධාන
2. සංස්ථාපිත සමාගම්, හවුල් ව්‍යාපාර, කේවල ස්වාමි ව්‍යාපාර, සමිති සංවිධාන
3. සංස්ථාපිත සමාගම්, හවුල් ව්‍යාපාර, සමිති සංවිධාන, කේවල ස්වාමි ව්‍යාපාර
4. හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර, සමිති සංවිධාන

16. "සුවසෙත වෛද්‍ය මධ්‍යස්ථානය" "SUWASETHA MEDICAL CENTRE" අයත් වන්නේ,
1. භාණ්ඩ අළෙවිකරන ව්‍යාපාරයකට ය. 2. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකට ය.
3. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකට ය. 4. සේවා සපයන ව්‍යාපාරයකට ය.

17. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වනුයේ,
1. කළමණාකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා දිම
2. ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා දීම.
3. ව්‍යාපාරයේ ලාභය දැන ගැනීම
4. පිරිවැය හා මූල්‍ය පාලනය

18. පහත දැක්වෙනුයේ ගිණුම් වර්ග කිහිපයකි. ඒ අතුරින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ගිණුම් පිළිවෙලට ඇතුලත් වනුයේ,
1. තොගය, ණයපොලී, විකුණුම්, ලැබිය යුතු පොලි
2. ලැබියයුතු ණය පොලි, කලින් ලද ගෙවල්කුලි, ලද පොලි, ණය පොලී
3. ලද පොලි, කලින් ගෙවූ ගෙවල් කුලි, ණය පෙළී, විදුලිය.
4. තොගය, බැංකුණය, කලින් ලද ගෙවල් කුලි, රක්ෂණය

19. ගනුදෙනුවක් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහනක් පහත දැක්වේ.
ණයහිමි ගිණුම හර රු. 8,000
මුදල් ගිණුම බැර රු. 8,000

1. රු. 8,000ක් වටිනා බඩුතොගයක් ණයට ගැනීම 2. ණයහිමියන්ට රු. 8,000ක් ගෙවීම
3. රු. 8,000ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම 4. ණයහිමියන්ගෙන් රු. 8,000ක වට්ටමක් ලැබීම ය.

20. ගිණුම්කරණ සමීකරණයේ වගකීම් අඩුවීමට හා හිමිකම් වැඩිවීමට බලපාන ගනුදෙනුව වනුයේ,
1. බැංකු ණයක් ව්‍යාපාරයේ මුදලින් ගෙවීම 2. ණයහිමියන්ගෙන් මුදල් ලැබීම
3. බැංකු ණය පොලී ගෙවීම 4. ණයහිමියන්ට අයිතිකරු පෞද්ගලික මුදලින් ගෙවීම.

21. මන්දිවි ලී බඩු සමාගම ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 150,000ක් වටිනා කාර්යාල ලී බඩු ද අලෙවි කිරීම සඳහා රු. 300,000ක් වටිනා කාර්යාල ලී බඩු ද අළෙවි කිරීම සඳහා රු. 300,000ක් වටිනා ලී බඩු උපකරණ ද හේසර සහ සමාගමෙන් ණයට ගන්නා ලදි. ලී බඩු උපකරණ රු. 400,000ක් ඒදිනට අත්පිට මුදලට විකුණන ලදි. ඉහත ගනුදෙනු වාර්තා කිරීමට අදාල මූලික පොත් පිලිවෙලින් දැක්වෙනුයේ,
1. පොදු ජ'නලය, ගැණුම් ජ'නලය, මුදල් පොත. 2. පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, ගැණුම් ජ'නලය
3. ගැණුම් ජ'නලය, ගැණුම් ජ'නලය, මුදල් පොත 4. පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, විකුණුම් ජ'නලය

22. ව්‍යාපාරයක සිහිවටන තීරු ලෙස සැලකෙනුයේ,
1. ලද වට්ටම් හා දුන් වට්ටම් 2. වෙළෙඳ වට්ටම්
3. වෙළෙඳ වට්ටම් හා මුදල් වට්ටම් 4. වෙළෙඳ වට්ටම්, දුන් වට්ටම් හා ලද වට්ටම්

23. සුළු මුදල් ප්‍රතිපූරණයට අදාල ද්විත්ව සටහන වනුයේ,
1. සුළු මුදල් පොත හර
වියදම් බැර
2. සුළු මුදල් පොත හර
ප්‍රධාන මුදල් පොත බැර
3. ප්‍රධාන මුදල් පොත හර
සුළු මුදල් පොත බැර
4. ප්‍රධාන මුදල් පොත හර
වියදම් බැර

❖ ලහිරු විසින් x සමාගමෙන් රු. 200,000 ක ලකුණු කල මිල සහිත භාණ්ඩ ණයට ගන්නා ලදි. වෙළෙඳ වට්ටම 10% කි. මෙම ණය මුදල 2017.03.31ට පෙර පියවුවහොත් 5%ක මුදල් වට්ටමක් දෙන බවට x සමාගමෙන් පොරොන්දු විය. ලහිරු විසින් 2017.03.25වන දින සම්පූර්ණ මුදල පිය වුයේ නම්,

24. ලහිරු විසින් පිය වු මුදල කීය ද?
1. රු. 190,000 2. රු. 180,000 3. රු. 171,000 4. ඉහත කිසිවක් නොවේ.

25. ඊට අදාලව ලහිරුගේ පොත් වල තැබිය යුතු ද්විත්ව සටහන කුමක් ද?
1. ණයහිමි ගිණුම හර රු. 180,000
ලද වට්ටම් බැර 9,000
මුදල් ගිණුම බැර 171,000
2. ණයගැති ගිණුම හර රු. 200,000
දුන් වට්ටම් ගිණුම බැර 10,000
මුදල් ගිණුම බැර 190,000
3. ණයහිමි ගිණුම හර රු. 200,000
ලද වට්ටම් බැර 20,000
මුදල් ගිණුම බැර 180,000
2. ණයහිමි ගිණුම හර රු. 180,000
ලද වට්ටම් ගිණුම බැර 18,000
මුදල් ගිණුම බැර 162,000

26. උදාරගේ ව්‍යාපාරයේ 2016.01.31 දින සුළු මුදල් භාරකරු සතුව ඉතිරිව තිබු මුදල රු. 550 කි. 2016 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම රු. 450ක් වු බව සුළු මුදල් භාරකරු පවසයි. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය හා ප්‍රතිපූරණ අගය පිළිවෙලින් දැක්වෙනුයේ,
1. රු. 1,000 හා රු. 550 2. රු. 450 හා රු 550
3. රු. 1,000 හා රු. 450 4. රු. 450 හා රු. 1,550

27. ව්‍යාපාරය සකස් කරන ලද බැංකු ගිණුමේ බැර ශේෂය, එම ව්‍යාපාරයේ,
1. වත්කම කි. 2. වගකීම කි 3. ආදායම කි. 4. වියදම කි.

28. පහත ගනුදෙනු අතුරෙන් වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව වනුයේ,
1. රු. 15,000ක බැංකු ණයක් ගැනීම. 2. රු. 100,000ක අමතර ප්‍රාග්ධනය යෙදීම.
3. රු. 2,000ක විදුලි බිල ගෙවීම 4. රු. 5,000 තොග ණයට විකිණීම.

29. පහත දැක්වෙන්නේ වෙළෙඳ ව්‍යාපාරයක ගනුදෙනුවකි.
❖ රු. 15,000ක බඩු තොග සුපුන්ට ණයට විකිණීම.
මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන වනුයේ,
1. මුදල් ගිණුම හර රු. 15,000
විකුණුම් ගිණුම බැර රු. 15,000
2. සුපුන් ගිණුම හර රු. 15,000
විකුණුම් ගිණුම බැර රු. 15,000
3. මුදල් ගිණුම හර රු. 10,000
සුපුන් ගිණුම බැර රු. 10,0000
4. සුපුන් ගිණුම හර රු. 15,000
මුදල් ගිණුම බැර රු 15,000

30. පහත සඳහන් දෑ අතුරෙන් වැඩිවීම හර, අඩුවීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය ට අදාල වනුයේ,
1. ආදායම් හා වියදම්
2. වගකීම්, හිමිකම් හා ආදායම්
3. වත්කම්, වගකීම් හා හිමිකම්
4. වත්කම් හා වියදම්

31. වත්කම් = වගකීම් + හිමිකම්
- 20,000 -15,000 -5,000
ඉහත සමීකරණයට බලපා ඇති ගනුදෙනුව වනුයේ,
1. රු. 20,000ක බැංකු ණය ගෙවීම. එහි ඇතුලත් පොලිය රු. 5,000 යි.
2. රු. 20,000 තොග රු. 15,000කට ණයට විකිණීම.
3. රු. 15,000ක ණය මුදලක් ලබා ගැනීම
4. අයිතිකරු රු. 20,000ක් තොග ද රු. 5,000ක් මුදල් ද ගැනිලි කිරීම.

❖ පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට මෙම තොරතුරු ඔබට සපයා ඇත.
A - රු. 25,000 ණයහිමියන්ට ගෙවන ලදි.
B - රු. 425,000 ගෙවල් කුලී ලැබුණා.
C - රු. 75,000 අයිතිකරු ගැනිලි කලා.
D - රු. 50,000 උපකරණ මිලදී ගත්තා
E - රු. 10,000 විදුලි බිල ගෙව්වා

32. මෙම ගනුදෙනුව අවසානයේ ව්‍යාපාරයේ මුදල් ගිණුමේ ශේෂයේ වැඩිවීම වනුයේ,
1. රු. 265,000 2. රු. 425,000 3. රු. 175,000 4. ඉහත කිසිවක් නොවේ.

33. ඉහත ගනුදෙනු අවසානයේ ව්‍යාපාරයේ මුළු වත්කම් හා මුළු හිමිකම වනුයේ,
1. රු. 315,000 හා රු. 340,000
2. රු. 175,000 හා රු. 365,000
3. රු. 50,000 හා රු. 750,000
4. රු. 265,000 හා රු. 425,000

34 . වියදම් වලට හා වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව වනුයේ,
1. A 2. D 3. C 4. E

35. රු. 100,000 කට ලකුණු කළ මිල වු උපකරණයක් මිලට ගැනීමේ දී 10% ක වෙළෙඳ වට්ටමක් හිමිවිය. එය,
1. ගැණුම් ජ'නලය තුළ එය රු. 90,000ක් ලෙස සටහන් කළ යුතුය.
2. පොදු ජ'නලය තුළ රු. 90,000ක් ලෙස වාර්තා කල යුතුය.
3. මුදල් පොත රු. 90,000 ක් බැර කළ යුතුය.
4. මුදල් පොත රු. 90,000ක් බැරට ද රු. 10,000ක් ලද වට්ටම් ලෙසද සටහන් කළ යුතුය.

36. ගිණුම් තුලනය කිරීම යනු,
1. ගිණුමක දෙපැත්ත සමවනතුරු ගනුදෙනු සටහන් කිරීම යි.
2. ගිණුමක හර බැර දෙපැත්තේ වටිනාකම් සම කිරීම යි.
3. ගිණුමක හර වැඩිවන විට බැර පැත්තට ගනුදෙනු ලිවීම යි.
4. ගිණුමක බැර වැඩිවන විට හර පැත්තේ ගනුදෙනු ලිවීම යි.

37. මුදල් වට්ටම් දෙනු ලබන අවස්ථාව වන්නේ,
1. මුදලින් ගෙවා භාණ්ඩ මිලට ගන්නා විට ය.
2. පසුව ගෙවීම් පදනම මත භාණ්ඩ මිලට ගන්නා විට ය.
3. එකඟ වු කාලය තුළ ගෙවීම් පියවන විට ය.
4. චෙක්පත් වලින් ගෙවීම් පියවන විට ය.

38. ගිණුමක කාර්යභාරය ඉටුකරන මූලික පොත වනුයේ,
1. විකුණුම් ජර්නලය 2. මුදල් පොත 3. ගැණුම් ජර්නලය 4. පොදු ජර්නලය

39. එක්තරා වෙළෙන්දෙක් ගත්මිලට 10% ක් ලාභ තබා ගෙන භාණ්ඩයක් රු. 9,900 අළෙවි කලේ නම් ඔහු එම භාණ්ඩය ගත් මිල කියද ?
1. රු. 900 2. රු. 10,890 3. රු. 990 4. රු. 9,000

40. ගැණුම් ජර්නලයේ එකතුව මාරු කෙරෙනුයේ,
1. ගැණුම් ගිණුමේ හරට ය.
2. දෛනික ගැණුම් පොතේ හරට ය.
3. ණයහිමි ගිණුමේ හරට ය.
4. ගැණුම් ගිණුමේ හරට ය.